# විශ්මයක් වූ බටනලාව



නදීන්ෂා හල්කේවල

# විශ්මයක් වූ බටනලාව

කතෘ
නදින්සා හල්කේවල

## කතෘගේ වෙනත් කෘති
## දඟකාර පුංචා

***ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසල***
***මාතලේ***
***8 ශ්‍රේණිය***
***2025.02.08***

ISBN -978-624-208-541-8

# පිදුම

*දුක්බර දැරියක් එදිනෙදා ජීවිතයේදී මුහුණ දීමට සිදුවන, මුණගැසෙන විවිධ කරුණු අලලා ලියැවුණු කෙටිකතාවකි.*

*මෙම පොත රචනා කිරීම සදහා මා ධෛර්යයමත් කළ මගේ ආදරණීය මව, පියා හා සහෝදරයා මේ මොහොතේදී තුති පුදමි.*

***නන් අයුරින් උදවු උපකාර කළ සැමට  මාගේ ප්‍රණාමය!***

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවකට සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදාන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි** ව්‍යාප්තිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් ලබන ජයග්‍රහණක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම කෘතිය අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශෂිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විදුහල<br>
මහනුවර

# විශ්මයක් වූ බටනලාව

මම මිහිරි. මම අවුරුදු 8 ක පුංචි දැරියක්. මගේ ගම අනුරාධපුරයේ. හරි ම නිස්කලංක පරිසරයක ජීවිතය ගෙවන මා ඉතාම දුක්බර ජීවිතයකට උරුමකම් කියන අසරණ කෙල්ලෙක් කීවොත් වැරදි නෑ.

දිනක් මගේ පියා රැකියාව කර ස්ථානයට මා එක්කරගෙන ගොස් ඒ ස්ථානය පෙන්වන විට මට මහත් සතුටක් ඇති වුවා. පරිගණක ක්ෂේත්‍රයේ නියුතුව රාජකාරි කරන මාගේ පියා කරන දේවල් ගැන මටත් ඉගෙන ගන්න මහත් ආශාවක් ඇති වුවා. ඒත් ඒ ආයතනයෙන් මට ඒවා අල්ලන්නවත් දෙන්නේ නෑ. මට ඇත්තටම හිතුණා අපේ ගෙදරත් පරිගණකයක් තිබුණා නම් කියලා. අපි ඉන්නේ අනුරාධපුරයේ. අම්මා බෞද්ධ ආගමේ නිසා හැම පෝයට ම අපි තුන්දෙනාම රුවන්වැලිසෑයට යනවා. ඒ වගේම තාත්තා කතෝලික ආගමේ නිසා හැම ඉරිදාට ම අපි පල්ලියට යනවා. ඒ තැන් නම් ඇත්තටම සිත සන්සුන් කරනවා. මගේ තාත්තාට නිවාඩුවක් ලැබෙන්නේ ඉරිදාට සහ පෝය දවසට විතරයි. ඒක නිසාම තමයි අපි පෝය දවසේම යන්නේ. ඉරිදාට පල්ලි යන එක නම් අපි නොවරදවාම කරනවා.

අපේ තාත්තාට සාමාන්‍ය බයිසිකලයක් තියෙනවා. අපි ඒකේ යන එන නිසා ගමන තවත් සුන්දරයි. වටපිටාවේ ගස්වැල්, ඇල දොල, සතා සිවුපාවන් දකින කොට මගේ සිත සතුටට පත්වෙනවා. මට ඇත්තටම කියලා නිම කරන්න බැරි සතුටක් ලැබෙනවා. අපි වන්දනාමාන කටයුතු අවසන් කිරීමෙන් පසු ඇවිදින විට අයිස් ක්‍රීම් වාහනයක් එහෙම එනවා. ඒක දුටු විගසම මං තාත්තට පෙන්නනවා.

තාත්තේ....තාත්තේ

ඇයි දුව

ආන්න තාත්තේ අයිස් ක්‍රීම් වෑන් එකක් ඇවිල්ලා.

එහෙම කිව්වම තාත්තා දන්නවා දැන් අයිස් ඕන වෙලා තමයි කියලා. එතකොට තාත්තා අපි හැමෝටම අරන් දෙනවා. මං තාත්තගේ අතේ එල්ලිගෙන තමයි හැමතැනම ඇවිද්දේ. ඔය විදිහට සතුටින් කාලය ගෙවුණා.

ඉතිං මට ශිෂ්‍යත්ව විභාගය ලියන්නත් ලං වුණා.

දෝණි.... එන්නකෝ

ඇයි තාත්තේ ?

ඔයා දැන් ශිෂ්‍යත්ව විභාගය සමත් වුණොත් මම ඔයාට මොනවද අරන් දෙන්න ඕනේ ?

මොනවත් එපා තාත්තේ

නෑ .... නෑ කියන්නකෝ මං එහෙනම් ඔයාට කම්පියුටර් එකක් අරන් දෙන්නද ?

හ්ම්.. බලමුකෝ තාත්තේ.

ශිෂ්‍යත්ව විභාගයත් අත ළඟටම ආවා. මම හොදට පාඩම් කරලා ඒකට ලෑස්ති වුණා. මම ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දුන්නා. ශිෂ්‍යත්ව විභාගය ඉවර වුණාම නිවාඩු දුන්න නිසා තාත්තාත් නිවාඩුවක් ගත්තා. මේ අතරතුරදී මට තව නංගි කෙනෙක් හරි මල්ලි කෙනෙක් හරි ලැබෙන්න යනවා කියලා දැනගන්න ලැබුණා. ඒකට නම් ගොඩක් සතුටු හිතුණා.

අම්මේ...අම්මේ ....

මොකද දරුවෝ ?

තාත්තා කිව්වා, අපේ ගෙදරට අලුත් සාමාජිකයෙක් එනවා කියලා.

ඇත්තද අම්මෙ ... ඇ

ආ....ඔව් පුතේ

එහෙනම් මට හොදයි නංගි කෙනෙක් ලැබුණොත්.

ඒ ඇයි?

සෙල්ලම් කරන්න පුළුවන්නේ...

ආ.... මෙයා බලන්නකෝ .. ඇයි ඔයා මල්ලිලාට කැමති නැද්ද ?

අපෝ... අම්මෙ මල්ලිලා හරි දඟයිනේ..එතකොට මට ගහයි.

හරි හරි බලමුකෝ... කවුරු වුණත් එකයිනේ . මම තාත්තට කියන්නම්කෝ මෙයාගේ නපුරුකම

අයියෝ .. අම්මෙ අර බලන්නකෝ එහා ගෙදර මල්ලි කොච්චර වද දෙනවද කියලා.. බඩු අදිනවා, කෑ ගහනවා, දඟලනවා මට නම් එපා වෙනවා.

අනේ... එහෙම තමයි ළමයෝ ඔයත් එහෙම තමයි හිටියේ ..
හරි හරි බලමුකෝ .. මං නම් ප්‍රාර්තනා කරන්නේ නංගි කෙනෙක් හම්බ වෙන්න කියලා!

ඔහොම ටික කාලයක් ගෙවී යද්දි හදිස්සියේම තාත්තාට පපුවේ අමාරුවක් ආවා. ඒ අවස්ථාවේදි රෝහල්ගත වූ තාත්තාට වෛද්‍යවරු පැවසුවේ තදබල හෘදයාබාධයක් කියායි. ටික කාලයක් විවේකීව සිටින මෙන් වෛද්‍යවරු පැවසුවා. දැන් රැකියාවට යෑමත් නතර කරා. ආයතනයේ සේවයට නොගිය ද ඔවුන් මාසික වැටුප ලබා දුන්නා. වැටුප ලබා දුන්නද එය බෙහෙත් සඳහා වියදම් වූ විට ප්‍රමාණවත් නොවී ය.

අම්මෙ...

ඇයි දුව..

අන්න අම්මා තාත්තා එනවා වගේ පේනවා. බෙහෙත් අරගෙන වෙන්න ඇති එන්නේ.

බෙහෙත් ගත්තද? මොකද දොස්තර මහත්තයා කිව්වේ?

බෙහෙත් නම් ගත්තා. ඒත් ඒවට යන වියදම තමා ප්‍රශ්නේ....පලතුරු එහෙම කන්න කිව්වා.

හරි හරි වියදම අපි බලමුකෝ.. අපි කොහොමහරි සල්ලි ටිකක් හොයාගන්න බලමුකෝ..

මට පුංචි කාලේ සිටම ගොඩක් ආසාවල් තියෙනවා. ඒත් මං ඒවා කාටවත් කියන්නේ නැතුව ඉන්න හිතුවා. සිහින සැබෑ වෙන දිනයක් දිහා බලා මම සුසුම් හෙලනවා. මම සංගීතයට, නැටුමවලට වගේ හැමදේටම ආසා කළා. නමුත් මම ඒක කාටවත් කිව්වේ නෑ. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵලත් ආවා. සමත් කියන ප්රතිඵලය ලැබුණු විගස මවගේත්, පියාගෙන් දැස්වල තිබුණු සතුට මට තාමත් මතකයි. තාත්තා
මගෙන් ඇහැව්වා,

දුව... මගේ දුවට මොනවද ඕනේ? මං එදා ඔයාට පරිගණකයක් ගෙනත් දෙන්නම් කියලා කිව්වා නේද?

නෑ .... නෑ .. ඕනේ නෑ තාත්තේ

ඒ වෙලාවේ මට ගොඩක් දේවල් ඉල්ලන්න නම් තිබුණා. ඒත් තාත්තාගේ බෙහෙත්වලට යන වියදමත්, ගෙදර ප්‍රශ්නත් නිසා කිසිවක් ඉල්ලන්නට හිතුණේවත් නෑ. ටික දවසක් ගත වුණා. අලුත් පාසලකට ඇවිත් තිබුණා. ඒ වන විට අම්මා රෝහල්ගත වුණා. තාත්තාට හොඳටම අමාරු වුණා.

තාත්තාට ගිය වියදම් වැඩි නිසා ගෙදර තිබුණ බයිසිකලයත් විකුණුවා. මං නොසිතූ අයුරින් මගේ තාත්තාගේ මරණය සිදු වූයේ, මව රෝහල්ගතව සිටින විටයි. අම්මාට තාත්තා බලන්න එන්නත් නෑ . අසල්වැසියන්ගේ පිහිට පතා මා හඬාවැලපෙමින් සිටින විට අපේ පල්ලියේ පූජක තුමා

තාත්තාගේ මරණයේ සියලු වැඩ කටයුතු අවසන් කර දීමට භාරගත්තා. ඒක අපි හැමෝටම ලොකු හයියක් වුණා. මගේ තාත්තා තම ආගම හා බැඳුණු කෙනෙක්.

මගේ අම්මා පවුලට කෙනෙක් රැගෙන ආවත් තාත්තා නැති අඩුව අපි හැමෝටම දැනුණා. මාගේ මල්ලිගේ ඉපදීමත්, මගේ ආදර පියාගේ වියෝවත් නිසාවෙන් මාගේ මව ඉතා අසරණ වූවා. ඇයට අපව රැකබලා ගැනීමට සිදු වූයේ ආර්ථිකය ශක්තිමත් නොවූ අවස්ථාවේදී ය.

අම්මයි, තාත්තයි දෙදෙනා හැම වෙලාවේදීම අපේ අනාගතය උදෙසා වෙර දැරූ අයුරුත්, ඉදිරිය ගැන අඩිතාලම් තැබූ අයුරුත් මට සිහි වෙද්දි දැනෙනුයේ ඇයි මගේ තාත්තාට මේ ඉක්මනින්ම අප අතරින් ගියේ කියලායි. මේ මතකය දිගේ දිගටම තනිවෙද්දි මට හිතෙන්නෙම අනේ මගේ තාත්තා හිටියානම් කියලාමයි. ඒත් මොනවා කරන්නද තාත්තා අප අතරින් වෙන්වුවද අපේ මතකයන් සදා නොමැකෙනු ඇත. තාත්තාගේ මරණයෙන් පසුව දුක මෙන් ම පශ්නද මතුවිය. ඒ ආර්ථිකය අඩාල වීම නිසා ය. අම්මාට මල්ලි බලාගන්න තියෙන නිසා රස්සාවකටවත් යන්න බෑ. අම්මලාගෙයි, තාත්තලාගෙයි අතර සිද්ධ වෙච්ච ප්‍රශ්නයක් නිසා අපිට උදවු කරන්න අම්මාගේ පැත්තෙන්වත්, තාත්තාගේ පැත්තෙන්වත් කවුරුත් ඉදිරිපත් වුණේ නෑ.

මේ ඔක්කොම බර අම්මා තනියෙන් දරාගත්තේ හරිම අමාරුවෙන්. මට අලුත් පාසලේ වැඩ කටයුතුවලටත් විශාල මුදලක් වියදම් කරන්න වුණා. අලුත් ඉස්කෝලෙදී සෞන්දර්ය විෂයක් තෝරගන්න ඕනේ. ඒත් මට එක විෂයක් තෝරගන්න හිතුණේ නෑ. මම පහ වසරට එනකන් චිත්‍ර ඇන්දා, නැටුවා, සින්දු කිව්වා හැමදේම කළා. ඒක නිසයි මට එක විෂයක් තෝර ගන්න එක අමාරු වුණේ.

මට එක වසරේ ඉදන් ලොකු හීනයක් තිබුණා නැටුම් කරන්න. ඒත්,එක සංගීත නාදයකට පුළුවන් වුණා මගේ මුළු නැටුම් සිහිනයම බොඳ කරන්න. ඉතිං මම සංගීතය විෂය තෝර ගත්තා. ඒක මගේ මුළු ජීවිතයටම වටින දෙයක් වුණා. නමුත් සංගීත භාණ්ඩවල මිල අධික වුණා. මං ඒක ගැන කල්පනා කරනවා අම්මා දැක්කා.

දුව.... මොනවද ඔය කල්පනා කරන්නේ?

මුකුත් නෑ අම්මේ...

නෑ නෑ ... මුකුත් නෑ නෙවේ. කියන්න

අම්මේ, මං සංගීත විෂය තෝරගත්තනේ, දැන් ඒකට බඩු ගන්න ඕනේ. ඒකට ගොඩක් වියදම් වෙනවනේ.

හ්ම්.... ඔව් පුතේ. ඒක තමයි. දැන් කරන්න ඕනේ මොනවද කියලාවත් මට තේරෙන්නේ නෑ. අපි තව මාස දෙකක් විතර ඉවසලා ඉන්න බලමුද පුතේ.

හරි අම්මේ...

ඇත්තටම මං අම්මට වද දෙන්න හිතුවේ නෑ. මං එහෙම කරන්න කැමතිත් නෑ. කමක් නෑ තව මාස දෙකක්වත් ඉවසන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මේ ඔක්කොම ප්‍රශ්න මැද්දේ අපි හැමෝම නින්දට ගියා. හැබැයි මම නින්දට ගිය අතරතුරේ මතක් වෙන්නෙම තාත්තා ගැන. එයා අද හිටියානම් අපිට මේ වගේ ප්‍රශ්න මොනවත් නෑනේ. එයා හිටියානම් මල්ලියි හැමෝම එක්ක අපිට එක පවුලක් වගේ ඉන්න තිබුණා. ඒත් එක්කම සංගීත භාණ්ඩයක් ගැනත් මතක් වෙනවා. හැබැයි කරන්න එක දෙයක් තිබුණා. ඒක තමයි ශිෂ්‍යත්වයේදී කියලා දුන්න පැපොල් බටනලාව හදන විදිහ. ඉතිං අපේ වත්තේ පැපොල් ගස් නම් තියෙනවා. ඕවා ඔක්කොම මතක තියාගෙනම මම නිදාගත්තා.

පහුවදා මම උදේ හයට විතර නැගිට්ටා. එදා සෙනසුරාදා දවසක්. මල්ලි බබාත් නිදි නිසා අම්මා නැගිටලා කෑම හදනවා. මමත් අම්මට ගිහින් උදවු කරා. පැය දෙකක් විතර ගත වුණා. මම මගේ බටනලාව හදන්න පටන් ගත්තා. ඉතිං මම අම්මට කියලා පැපොල් බටයක් කඩාගෙන බටනලාවක් හැදුවා. ලේසියෙන් හැදුවත් පිඹින වැඩේ නම් අමාරු වුණා. මම ඕක නිකං පුරුදු වෙන්නනේ හැදුවේ. ඒක නිසා එච්චර ගාණක් නෑ. පැපොල් බටනලාවෙන් පිඹින එක අමාරු වුණත් මොනවා කරන්නද?

අම්මට වද දෙන්නත් බැනේ. මට බටනලාවක් ගැන හිතුණෙත් සාමාන්‍යයෙන් බටනලාව අනිත් සංගීත භාණ්ඩවලට වඩා මිලෙන් අඩු නිසයි. මම අපේ ඉස්කෝලේ ළමයින්ගෙන් අහලා තමයි දැන ගත්තේ. මගේ යාළුවෙක් ලග ගිටාර් එකක් තියෙනවා. ඒක රුපියල් හැටපන්දාස් ගාණක්. තව එයා ලග වයලීන් එකකුත් තියෙනවා. මම කොහොමත් දන්නවා ඒවා ගන්න තරම් මුදලක් නැති බව. ඒත් බටනලාවත් හරි ලස්සන භාණ්ඩයක්නේ.

මගේ සෙනසුරාදා දවස පැපොල් බටනලාවත් එක්කම ගෙවුණා. අම්මට හැම දෙයක්ම එකවර කරන්න බැරි නිසා ඉරිදා දවසේම මම අම්මට මල්ලි බලාගන්න උදවු වෙනවා.

සඳුදා ඉස්කෝලේ යන්න ඕන නේ. මගේ ඉස්කෝලේ හරිම දුර තියෙන්නේ. ඒක නිසා මම පාන්දර හතරට නැගිටිනවා. නැගිටලා ටිකක් වෙලා පාඩම් කරලා තමයි ලෑස්ති වෙන්නේ.

දුව... ලෑස්ති වෙලා ඉවර ද?

ඔව් අම්මා...

ආ.. මෙන්න පුතේ සල්ලි

එහෙනම් මගේ දුව පරිස්සමට යන්න හරිද බුදුසරණයි!

මම ඉස්කෝලේ යන්නේ පාරේ බස් එකේ. ඒකට අවශ්‍ය මුදල් අපේ පල්ලියේ පූජක තුමා අපිට ලබා දෙනවා. පාරේ බස් එකේ යන නිසා කලින් පාරට යන්න ඕනේ. මම පයින් යන නිසා ගෙදරින් 5.30 ට විතර යනවා. ඒ වගේම ගොඩක් දුර යන්නත් තියෙනවානේ. ඉතිං අද සංගීතයත් තියෙනවා. මම සංගීත කාමරයට යද්දි හැම ළමයෙක්ටම වගේ සංගීත භාණ්ඩයක් තියෙනවා මම දැක්කා. ඒ අතරම ටීචර් වාදනයත් පටන් ගත්තා. සංගීත භාණ්ඩ තිබුණේ නැති ලමයෙක්ට හිටියෙ මම විතරයි. මට සංගීත භාණ්ඩයක් නැතුව දැන් මාස 3,4 ක් විතර වෙනවා. ටීචර් වාදනය මගක් දුර කරලා මැදදි නැවැත්තුවා. නවත්තලා මට කතා කලා.

මිහිරි

ඇයි ටීචර්?

තාම ඔය ළමයා සංගීත භාණ්ඩයක් ගත්තේ නැද්ද?

අනේ නෑ ටීචර්

හා හා බලමුකෝ...

ඔය විදිහට සංගීත පීරියඩ් එක ඉවර වුණා. ළමයි  හැමෝම ටීචර්ට වැඳලා ගියා. ඒත් ටීචර්  මට කතා කරලා මාව නවත්තගත්තා.

මිහිරි

ටීචර්

ඇයි පුතේ ඔයා තාම මොනවත් භාණ්ඩයක් ගත්තේ නැත්තේ ?
ටීචර් මේ දවස්වල අම්මට හොඳටම අමාරුයි. අම්මා කිව්වා තව  මාස දෙකකින් විතර ගන්න බලමු කියලා.

හ්ම්... මිහිරිගේ තාත්තා මොනවද කරන්නේ ?.

ටීචර් මගේ තාත්තා නෑ. අම්මා කුලී වැඩ කරන්නේ

මිහිරිට  තව  කවුද  ඉන්නේ ?.

මල්ලි කෙනෙක් ටීචර්. එයාට දැන් අවුරුදු හතරක් විතර ඇති.

අනේ හරි පුතේ. තාත්තා ගැන මතක් කරන්න සිද්ධ වුණ එකට මට සමාවෙන්න. දැන් යන්න පුතේ.

මම ටීචර්ට වැඳලා එහෙමම පන්තියට ගියා.  තාත්තා ගැන කියද්දිත් මගේ ඇහැට කඳුළු ආවා. ඒ මොනවා වුණත් මම අනිත් විෂයනුත් හොඳින් ඉගෙන ගත්තා.

අම්මා මේ විඳින දුකට සාධාරණයක් කරන්නත් මට පුළුවන් වෙන්න ඕන නේ. මම සංගීතය ගායනයටත් කැමති. ඉස්කෝලේ උත්සවයක් එහෙම තියෙද්දි ගායනා කරන්න මම ඉන්නවා. ඉතිං මම පාසලේ වැඩ කටයුතු හොඳින් කරගෙන ගියා. කාලය ගත වුණා. මල්ලිත් ලොකු වුණා. එයාට නම් ශිෂ්‍යත්ව විභාගය සමත් වෙන්න බැරි වුණා. ඒ නිසා එයා හිටපු ඉස්කෝලේම හිටියා. අම්මා කිව්වේ ඒක ඇත්තටම පහසුයි කියලා. අපේ ඉස්කෝලේ උත්සවයක් තිබුණා.

මම ඒකේ ගායනා කරන්න ඉන්න නිසා මම ඉස්කෝලෙට ගියපු ගමන් සංගීත කාමරයට ගියා. මට ඒ වෙලාවේ දි රනුලි කියලා නංගි කෙනෙක් හම්බුණා. එයා මගේ මල්ලි වගේමයි. එයා හරි ම පෝසත්. අනේ ඒ වුණාට එයා හරිම හොඳයි. එයා මාත් එක්කත් හොඳින් කතා කලා. එයා හිටියේ වාදනය කරන්න. ඒ වගේම එයාට හැම සංගීත භාණ්ඩයක්ම තියෙනවා. බටනලාවකුත් තියෙනවා. ඒක දකිද්දි නම් මට ආසා හිතුණා.

අක්කි

ඇයි නංගි

ඔයාට බටනලා ගහන්න පුළුවන්ද ?.

පුළුවන් නංගි. හැබැයි මට බටනලාවක්වත් නෑ.

ඒ කිව්වේ ?

මට මුකුත් සංගීත භාණ්ඩයක් නෑ.

අනේ ඇත්තද ? මං ඔයාට මගේ බටනලාව දෙන්නද ?

අනේ එපා නංගි. ඔයාට ගෙදර අම්මයි, තාත්තයි බනියිනේ.

නෑ... නෑ අක්කි

ඔයාගේ තාත්තයි, අම්මයි මොනවද කරන්නේ ?

අපේ තාත්තා ඩොක්ටර් කෙනෙක්, අම්මා ටීචර් කෙනෙක්.

ඔයාලා කොහෙද ඉන්නේ නංගි ?

අපි දැන් අනුරාධපුර ඉන්නේ අක්කි. ඉස්සර නම් හිටියේ මහනුවර.

මං අපේ අම්මාගෙන් අහලා බලන්නම්කෝ නංගි.

අක්කාගේ අම්මයි, තාත්තයි මොනවද කරන්නේ?.

මගේ තාත්තා නෑ නංගි. අම්මා කුලී වැඩ කරනවා.

හරි අක්කි.

මට මේ ඉස්කෝලෙන් හම්බුණු හොඳම ළමයෙක් තමයි එයා. එයා කොච්චර පෝසත් වුණත් කිසි ම අහංකාරකමක් නෑ. හැම කෙනෙක්ටම උදවු කරනවා. මං ගෙදර ගිහින් එයා ගැන අම්මටත් කිව්වා.

අම්මේ....මට අද ඉස්කෝලෙදි නංගි කෙනෙක් හම්බුණා. එයා අපේ මල්ලිගේ වයස. අම්මා ඒ නංගි අපේ මල්ලි වගේමයි .

ඉතිං එයා ඔයාට මොනවද කිව්වේ ?

එයා හරිම පෝසත් කෙනෙක් අම්මේ. එයාට හැම සංගීත භාණ්ඩයක්ම වගේ තියෙනවා. එයා මගෙන් ඇහුවා එයාගේ බටනලාව මට දෙන්නද කියලා. එයාට බටනලාව නම් ගහන්න බෑ.

ඇත්තමද පුතේ ? ඔයා මොනවද කිව්වෙ ?

මං කිව්වා, නංගි ඔයාලගේ ගෙදර අය බනීනේ කියලා.

ඊට පස්සේ ?

එයා කිව්වා, නෑ නෑ මට බනින්නේ නෑ කියලා.

අම්මේ මම ඒක ගන්න ද ? එයා කිව්වා ගෙදරින් අහලා බලලා ගේන්නම් කියලා.

ම්ම්.. එයාට බනින්නේ නැත්තම් ගන්න පුතේ.

ඊට පහුවදාත් රනුලි නංගි බටනලාව ගෙනත් තිබ්බා. එයා මාව හම්බවෙන්න පන්තියටම ඇවිත්.

එයා අපේ පන්තියේ ළමයෙක්ට කතා කරලා තමයි මාව හොයාගත්තේ.

මිහිරි.... මිහිරි .... මේ නංගි කෙනෙක් ඇවිල්ලා ඔයාව හම්බවෙන්න.

ආ.. හරි සෙනුරි.

ඉතිං මමත් ගියා කවුද ආවේ බලන්න. එතකොට තමයි දැක්කේ රනුලි නංගි කියලා.

අක්කේ..අක්කේ

ඇයි නංගි ?

අක්කේ මම අපේ ගෙදර කට්ටියගෙන් ඇහුවා. එයාලා කිව්වා දුන්නට කමක් නෑ කියලා.

අනේ ඇත්තමද නංගි. ඔයාට ගොඩක් ස්තූතියි. ඒ වගේම ගොඩක් පිං ඔයාට.

ඒක සුළු දෙයක්. මං එහෙනම් යන්නම් අක්කි.

හරි නංගි.

රනුලි නංගි බටනලාව ගෙනත් තිබ්බ දවසේ හරියටම සංගීතය තිබ්බා. මං සංගීත කාමරයට යද්දිත් රනුලි සංගීත ටීචර් එක්ක කතා කරමින් හිටියේ.

මිහිරි

ටීචර්
ඔයා භාණ්ඩයක් ගත්තද පුතේ ?.

අනේ නෑ ටීචර්. ඔතන ඔය ඉන්න රනුලි නංගි තමයි මට මේ බටනලාව දුන්නේ...

අක්කේ.. මෙයා තමයි මගේ අම්මා.

අනේ ඇත්තමද නංගි. අනේ ටීචර් ඔයාලට ගොඩක් පිං.

රනුලි, ඔයා අපේ මේ මිහිරි ගැනද කිව්වේ...? මං මිහිරිට කියලා දන්නවනම් අලුත්ම එකක් අරගෙන දෙනවානේ...

අම්මා මිහිරි අක්කව දන්නවද?

ඔව් පුතේ. මිහිරිට සංගීතය උගන්වන්නේ මම නේ.

අනේ ටීචර් අලුත් ඒවා ඕන නෑ මට මේකත් ගොඩක් වටිනවා.

මිහිරිගේ ගම කොහෙද ?

අනුරාධපුරයේ ටීචර්.

අනේ අපිත් අනුරාධපුරයෙනේ ඉන්නේ...
අපි දෙන්නා නිවාඩු මාසේ එන්නම්කෝ මිහිරිව බලලා යන්න.

සංගීත භාණ්ඩයක් නැති ප්‍රශ්නය නම් කොහොමහරි විසඳුණා. ඉස්කෝලේ සංගීත වාදක කණ්ඩායමේ බටනලා ගහන්න මාව තෝරගත්තා. මට මේ තරම්වත් බටනලා ගහන්න පුළුවන් වුණේ රනුලි නංගි නිසා. මටං එයා ඒ කරපු උදව්ව කවදාවත් අමතක කරන්නේ නෑ. මට දැන් එයා මගේම නංගි කෙනෙක් වගේ. කිව්වා වගේම නිවාඩු මාසේ රනුලියි, අපේ සංගීත ටීචරුයි අපේ ගෙදර ආවා. මට ඇත්තටම ගොඩක් සතුටුයි.

අම්මේ.... අම්මේ..

මෙයා තමයි මට අර බටනලාව දුන්න නංගි. මේ ඉන්නේ එයාගේ අම්මා. මෙයා තමයි අපේ සංගීත ටීචර්.

අනේ ඇත්තමද දුව ?

ඔව් අම්මා...

අනේ.. ඔයගොල්ලන්ට ගොඩක් ස්තුති වෙන්න ඕනේ

ඕක සුළු දෙයක්නේ.

රනුලිලා අපේ ඉගෙනීම් කටයුතුවලටත් ගොඩක් උදවු කරනවා. මට විතරක් නෙවේ. අපේ මල්ලිටත් උදවු කරනවා. රනුලිත් අපේ මල්ලිගේ වයස තමා. අපේ අම්මා රනුලිගේ අම්මත් එක්ක හොඳට කතා කලා. මේ නිවාඩු මාසේ රනුලිලා ගෙදර ආපු නිසා සතුටින් ගෙවුණා. ඒත් මට තාමත් තාත්තව මතක් වෙනවා.

ටික කාලයක් සතුටින් ගෙවුණා. මම දහය වසරටත් ගියා. ඉස්කෝලේ බටනලා ගහන්න වාදක කණ්ඩායමේ ඉන්න නිසා තරගවලට යන්න සිද්ධ වුණා. මට ඒකල තරගවලින් ප්‍රථම ස්ථානය ලබා ගන්න පුළුවන් වුණා. පලාත් තරගවලට යන්න පුළුවන් වුණා. මම පුහුණුවීම් වලට ඉදලා එනකොට අම්මට එකපාරටම ලෙඩ වෙලා. ඒ වන විටත් රනුලිගේ තාත්තා ඇවිත් අපේ අම්මව ඉස්පිරිතාලේට එක්කරගෙන ගිහින්. අම්මටත් තාත්තාට වගේම පපුවේ අමාරුවක් ඇවිල්ලා. මට ගොඩක් බය හිතුණා. මම ගෙදරට වෙලා මල්ලිවත් බලාගෙන හිටියේ. මල්ලිත් හොඳටම කලබල වෙලා.

අක්කේ... අක්කේ

ඇයි මල්ලි
අන්න අක්කේ අපේ අම්ම රනුලිලාගේ තාත්තා එක්කරගෙන එනවා.

අනේ ඔව්මයි මල්ලි

මල්ලි.. ඔයා ගිහින් අම්මට ඉන්න ඇඳ හදන්න.

මම රනුලිගේ තාත්තාත් එක්ක ටිකක් කතා කරලා එන්නම්.
හරි අක්කේ..

අනේ අම්මේ... මොකද වුණේ ? බෙහෙත් ගත්තද ?

ඔව් පුතේ . බෙහෙත් ගත්තා. හොඳ වෙලාවට මේ මහත්තයා හිටියේ.

අනේ ඩොක්ටර් අංකල් ඔයාට ගොඩක් පිං

හරි හරි පුතේ... අම්මේ හොදට බලාගන්න හරිද ?

හරි ඩොක්ටර් අංකල්

ඉතිං අම්මට අසනීප නිසා ගෙදර වැඩ ටික බලාගත්තේ මම. අම්මට හොදටම අමාරුයි. බෙහෙතුත් තව ඉවර නෑ. ටික කාලයක් අම්මා අමාරුවෙන් හිටියේ. මම කොහොමහරි මල්ලිව ඉස්කෝලේ යැව්වා. ඒ වුණත් මම මේ දවස් ටිකට ඉස්කෝලේ ගියේ නෑ. ඔක්කොම වැඩ ඉවර කරලා මම අම්මා ළඟට ගියා.

මගේ දුවේ, මට ඔයාට වැදගත් දෙයක් කියන්න තියනවා.

මොකක්ද අම්මේ ?

දුව ඔයා තමයි දැන් මල්ලිත් බලාගන්න ඉන්නේ.

අනේ අම්මේ එහෙම කියන්න එපා.

නෑ නෑ පුතේ. ඔයාගේ අර රනුලි නංගි ඉන්නේ, එයා ඇත්තටම ඔයාගේ නංගි තමයි. තාත්තාගේ මරණය දවසෙම තමයි නංගියි, මල්ලියි ඉපදුණේ. ඒ දෙන්නා නිවුන්නු. තාත්තාගේ මරණය නිසා අපිට හොඳටම අමාරු වෙන නිසා මම එක්කෙනෙක් ව දෙන්න තීරණය කළා. එතන හිටිය දොස්තර මහත්තයා නංගිව හදාගන්න ඉල්ලුවා. ඒ වෙද්දිත් එයාලට ලමයි ඉදලා නෑ. ඒක නිසා තමයි එයාලා නංගිව ගත්තේ. දැන් ඒක දන්නේ අපි දෙන්නා විතරයි පුතේ. ඒක ගැන අර දොස්තර මහත්තයත් දන්නවා පුතේ.

අනේ ඇත්තමද අම්මේ . එතකොට රනුලි කියන්නේ මගේම නංගිද ? ඇයි අම්මා මට මේවා කලින් කිව්වේ නැත්තේ ?

පුතේ මම මේක රහසක් විදිහට තියාගන්න හිටියේ.. ඒත් පුතේ මටත් මේ ලෝකෙන් ඉක්මනින්ම යන්න සිද්ධ වෙන නිසා තමයි මම මේක ඔයාට කිව්වේ.. මමත් ගියහම ඔය දෙන්නා මේ ලෝකේ තනි වෙනවානේ.. දැන් අපිට උදවු කරන්න හරි ඉන්නේ මේ දොස්තර මහත්තයලා විතරනේ.

අම්මේ එතකොට මම මේක මල්ලිලාට කියන්න එපා ද ?

එපා පුතේ..

ටික කලක් ගෙවී යද්දි අපි කවුරුත් නොසිතූ දෙයක් සිද්ධ වුණේ. මගේ අම්මට හොදටම ලෙඩේ සනීප වුණා. මේ හැම දෙයකටම අවශ්‍ය මුදල් අපිට දුන්නේ රනුලිගේ තාත්තා. ඇත්තටම එයානම් හරිම හොද මනුස්සයෙක්. එයා විතරක් නෙවේ. ඒ ඔක්කොම හරිම හොද කට්ටිය.

අම්මටත් සුව වෙච්ච නිසා මගේ සංගීත තරග වලට ඉදිරිපත් වෙන්න මට පුළුවන් වුණා. ඉතින් සමස්ත ලංකා බටනලා තරගාවලියෙන් දෙවන ස්ථානය ලබා ගන්න මට පුළුවන් වුණා. මේ හැම දෙයකටම අපිට උදවු වුණේ රනුලිලා.

බටනලාව නිසා මට මගේ නංගිවත් හම්බුණා. මගේ ජීවිතයත් ජය ගන්න මට පුළුවන් වුණා. මම ලබපු ලොකුම ජයග්‍රහණය තමයි ඒක.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ නම් නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්